# කණ්හ ජාතකය

තවද එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් යමක ප්‍රාතිහාර්යය අරභයා මේ ජාතකය වදාළ සේක. සර්වඥයන් යමක ප්‍රාතිහාර්යය කොට දිව්‍යලෝකයෙහි වැස මහපවුරුණු දිනයෙහි සකස්පුර දොරට බැස මහත් වූ පිරිවරින් ජේතවනායට වන් කල්හි භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ ඇවැත්නි තථාගත නම් වූ සර්වඥයන් වහන්සේ නම් අසමධුරසේක. සර්වඥයන් වහන්සේ විසින් උසුලන ලද්දා වූ ධූරය උසුලන්නට සමර්ථ වූ අන් කිසි සත්වයෙක් නම් නැත්තේය. මක්ඛලිගෝසාලාදී වූ ශාස්තෘහු සදෙන අපි යමක ප්‍රාතිහාර්ය කරම්හ. අපි යමක ප්‍රාතිහාර්යය කරම්හයි කියා එක ප්‍රාතිහාර්යකුත් නොකළෝය. සර්වඥයන් වහන්සේ වූකලි ඉතා ආශචර්යයවත්සේකැයි බුදුන්ගේ ගුණ කිය කියා උන් සේක. එකල්හි සර්වඥයන් වහන්සේ අවුත් මහණෙනි දැන් කවර නම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාළසේක. ස්වාමීනි අන් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. නුඹ වහන්සේගේ මෙබඳු ගුණ කථාව කිය කියා උනුම්හයි කී කල්හි, මහණෙනි දැන් ඉසුළු ධූරයක් කවරෙක් උසුලා ද පෙර තිරිසන් යොනියෙහි උපන්නාවූ මම මා හා සම ධූරය ඇති කිසිවක්හු නොලද්දේම් වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍ය කරණ කල්හි අප මහා බෝසතාණෝ ගවයෝනිහියෙහි උපන්නාහුය. ඉක්බිත්තෙන් ඔහු බාල්‍ය අවස්ථාවෙහිම ඔහුගේ ස්වාමිදරුවෝ එක් වෘද්ධ වූ ස්ත්‍රියකගේ ගෙයි වැස නවාතැන් කුලියට පිරිසිඳ දුන්නාහුය. ඒ වෘද්ධ ස්ත්‍රී මහබෝසතානන් කැඳ බත් ආදීන් පෝෂ්‍යකරන්නී පුත් තනතුරෙහි තබා වැඩුය. ඒ තෙමේ ආර්යකාකාලයෙහි මේ නමින් ප්‍රසිද්ධව වැඩිවිය පැමිණියේය. අඤ්ජනවර්ණව ගම ගොන් හා කැටිව ඇවිදින්නේය. ශිලාචාරයෙන් යුක්තය. ගම් දරුවෝ ඇඟත් කරත් එල්ලීගෙණ ඇවිදිති. වාලඩියත් අල්වාගෙණ ඇවිදිති. පිටට නැගීත් ඇවිදිති. ඒ වෘෂභයා එක් දවසක් මෙසේ සිතුයේය. මාගේ මෑණියෝ දුක්ඛිතයෝය. මා පුත් තනතුරෙහි තබා වඩා දුකසේ පෝෂ්‍ය කළෝය. එසේ හෙයින් මම බැලමෙහෙකොට මුන් දුප්පත් කමින් මිදුයේ වී නම් යහපත් වන්නේ යයි සිතා එතැන් පටන් බැලමෙහෙයක් සොයමින් ඇවිදින්නේයව. ඉක්බිත්තෙතන් එක් දවසක් සාත්තුනායක පුත්‍රයෙක් පන්සියයක් ගැල් හා සමග විසම වූ ගැඹුරු තොටකට බටයේය. ඔහුගේ ගොන් ගැල් ගොඩගන්න අසමර්ථයෝය. පන්සියයක් ගැල් ගොන් වියඬු පරම්පරායෙන් යොදන ලද්දාහු එකගැලකුත් ගොඩනගාගත නුහුනුවිය. බෝධිසත්වයෝ ද ගොන් හා සමග ඒ ඒ තැන්හි ඇවිදිති. සාත්තුනායක පුත්‍රයාද ගෙන් ලකුණු දත්තේය. එතෙම මේ ගෙරින් අතුරෙහි මේ ගැල් ගොඩගන්න සමර්ථ වූ වෘෂභජාතියෙක් ඇද්දෝහෝයි පරීක්ෂා කරන්නේ බෝධිසත්වයන් දැක මේ අජානීයයා මාගේ ගැල් ගොඩගන්නට සමර්ථවන්නේය. මොහුගේ ස්වාමීදරුවෝ කවුරුදැයි ගොප්ලලන් අතින් විචාලෝය. තවද පින්වත්නි මොහුගේ ස්වාමීදරුවෝ කවුරුන්ද මම මොහු ගැළයොදා ගැල් ගොඩනැගූ කල්හි මිළ දෙමි කිය එකල්හි ගොපල්ලා කියනනේ අල්වාගෙණ යොදාගත මැන. මෙතන මොහුගේ ස්වාමීදරුකෙණෙක් නැතැයි කිය. ඒ සාත්තුනායකයා එබස් අසා ඔහු ලගට නැහැලනුවක් බැඳ අදනේ සිටිතෙනින් සොළවන්නට අසමර්ථ විය. බෝධිසත්වයෝ වනාහි ගැල් ඇදී කුලී කීකල්හි යෙහි සිතා නොගියාහුය. සාත්තුනායක පුත්‍ර ඔහුගේ අභිප්‍රාය දැන යාච්ඤාකරන්නේ පන්සියයක් ගැල් තොප විසින් ගොඩනැගූ කල්හි එකි එකි ගැලකට කහවණු දෙකක් කුළි කොට දහසක් දෙමි කීය. එකල්හි බෝධිසත්වයෝ තුමුම ගියාහුය. ගැල් සමීපයට ගිය බෝධිසත්වයන් දැක වෘෂභය ගැල්හි යෙදුයේය. එකල්හි බෝධිසත්වයෝ එක වේගයෙන්ම ඔසවා ගොඩනැගූවාහුය. මෙම ක්‍රමයෙන් සියලු පන්සියයක් ගැල්ම ගොඩ නැගුය. සාත්තනායක පුත්‍රතෙම එකී එකී ගැලකට එකි එකී කහවණුවක් බැගින් පන්සියයක් කහවණු පොදිබැඳ ඒ මහාබෝසතානන් කර බැන්දේය. ඒ බලා බෝධිසත්වයෝ මේ තෙම මට දෙමි පළමු නියමකළ කුලී නොදෙන්නේය. එසේ හෙයින් දැන් මොහු යානොදෙම්හයි ගොස් ඇමට පෙරතුම ඉදිරියේ ගැල අසුරාගෙණ සිටියෝය. ඉවත්කරන්නට උත්සහ කරන්නාහු ඉවත්කොට නුහුණුවාහුය. එවෙලෙහි සාත්තුනායක පුත්‍ර සිතන්නේ මේ තෙම තමාට කුලී මදි නියාව දතවනැයි සිතා එකවස්ත්‍රයක දහසින් පොදියක් බැඳ මේ තෙම තොප ගැලනැගූ කුලියයි කියා කරබැඳ එල්වුයේ. මහබෝසතානෝ දහසින් බැඳි පියල්ලගෙණ මෑනියන් සමීපයට ගියාහ. ගම් දරුවෝ ඒ දැක ආර්යකාකාළයන්ගේ කර කිමෙක්දැයි බෝධිසත්වයන් සමීපයට එන්නාහුය. බෝධිසත්වයෝ ඒ කුඩා කොල්ලන් පසුපස්සෙහි දිව ලුහුබඳවා යවා මෑනියන් සමීපයට ගියෝය. පන්සියයක් ගැල් ගොඩනැගූ බැවින් ඇස් රතුව මිරිකී ගියාවූ ස්වරූප ඇතිවූය. වෘද්ධ උපාසිකාවෝ මහබෝසතානන් කරදහසින් බැඳි පියල්ල දැක මුන් විසින් කොයිදී ලබනලදැයි ගොපලු දරුවන් අතින් විචාරා එපවත් අසා දරුව කිමෙක්ද මම තොප ලත් කුළියෙන් ජීවත්වනු කැමැත්තෙම්ද කුමක් සිතා තොපි මෙබඳු වූ දුක් අනුභව කළාහුදැයි කියා මහබෝසතානන් උනුපැනින් නාවා සියලඟ තෙල් ගල්වා පැන් පොවා සප්පාය භෝජනය අනුභව කරවා සන්තර්පණය කොට ජීවිත පර්යාවසානයෙහි බෝධිසත්වයන් හා සමඟ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. බුදුරජානන් වහන්සේ මහණෙනි සර්වඥයන් වහන්සේ අසමධුරවූසේක් දැන් මතු නොවෙයි පෙරත් අසමධුරවෝවෝම වේදැයි වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ කණ්හ ජාතකය නිමවා වදාල සේක.

එසමයෙහි වෘද්ධ ස්ත්‍රී නම් මේ උත්පලවර්ණ මහාස්ථවිරාය. ආර්යකාකාල වෘෂභයා නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසෙක.